ලංකාවිත්ති
LANKA VITHTHI

LANKA VITHTHI
P. O. BOX 6 4 6 7 8
LONDON NW3 9LS
E N G L A N D

*Phone* : 0 2 0 7 4 2 8 9 3 8 8
*Fax* : 0 8 7 1 9 0 0 5 1 6 3
*E-mail* : lanka.viththi @ virgin.net

කර්තෘ : දයා ආනන්ද රණසිංහ
*Editor* : Daya Ananda Ranasinghe
චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
*Art* : Chandana Seneviratna
පරිගණක කටයුතු : චන්න කබ්රාල්
*Computer Graphics* : Channa Cabraal
ඡායාරූප : ආනන්ද කාරියවසම්
*Photography* : Ananda Kariyawasam



## පහළොස් වසරකට පසු.....!

**මේ** අද පළවන්නේ ලංකාවිත්ති පුවත්පතට අවුරුදු පහළොව සම්පූර්ණ වන කලාපයයි. අවුරුදු පහළොවක් පුරා අප ආ ගමනේ ආශ්චර්යය අපට මෙන්ම අපේ පාඨක සහෘද යින්ටද දැනී ඇත. දිනයක් දෙකක් හෝ ප්‍රමාද වුවහොත් ඔවුන් නොයිවසිලිවන්ත වන හැටි- යෙන් වටහාගත හැකිය. ඔවුන්ගේ ඒ නොයිව සිල්ල අපේ සාර්ථකබව යම් පමණකින් ප්‍රකාශ වන ඉඟියකි. පිටරටක සිට පළකරන මේ පුවත්පතට ලංකාවේ පළවන සිංහල පුවත්පත- කට වඩා අවංකකමක් ඇතැයි ලංකාවේ අපේ පත්‍රය කියවන බොහෝදෙනා ලියා එවා තිබේ. ඔවුන් ඒකියන්නේ හෘදයාංගමමය. අප ලියන වදනකින්, කවියකින් සැතපුම් හත්දහසක් ඈත සිට වුවද අපේ හෘදය ස්පන්දනයවන ආකා- රය ඔවුනට දැනී ඇත. ඒසා වෙනත් සතුටක් කොහෙන් ලබන්න ද ?

අපටම ආවේණික අනන්‍යතාවක් තිබේ. පුවත්පතක් ලෙස අපි ස්වාධීනත්වයක් ගොඩ නගා ගත්තෙමු. අපේ ස්ථාවරය කුමක්දැයි ලංකාවිත්ති කියවන සියල්ලෝම පාහේ දැන් දැන සිටිති. මේ අවුරුදු පහළොව තුළ අපේ ප්‍රතිපත්ති එක දශමයකින් හෝ වෙනස් වුනේ නැත. කිසිදු දේශපාලනික හෝ වෙනත් අන්ද මේ බලපෑමකට හෝ අප ගොදුරු වුවේ ද නැත. කන්න හිතුනාම අපට කබරගොයා තල ගොයා වුයේද නැත. වාසියක් ලබන්නට ප්‍රති- පත්ති තබා, අබමල් රේණුවක දෙයක් අප පාවා දුන්නේ ද නැත.

සිංහල පුවත්පතක් සතුව තිබිය යුතුයයි අප විශ්වාසකරන කැපවීම මෙන්ම, අප රටේ ගෞරවය, හැදියාව, සාරධර්ම ආරක්ෂා වන අයුරින් පෑන ලෙලවමින් පිටරටවල වෙසෙන අපේ සිංහල ජනතාවට ආභරණයක්, අත්වැල ක් වීම ලංකාවිත්ති අරමුණ බව අප මුල්ම පත්‍රයෙන් කීවෙමු. අවුරුදු පහළොවකට පසුව අද වුව ද එසේම කියන්නට අපට හැකියාව තිබේ. ඒ අපේ හෝල්මාක් එක ය.

ඒ දුක්බදායක කාලයේ සිංහල ජනතාව අත් නොහැර ඔවුන් සමග වෙසෙමින්, ඔවුන් ගේ සිතේ ඇති දුක කණගාටුව බෙදාගනිමින් ඔවුන් දිරිමත් කරවන වදනක් ඔවදනක් ලංකා විත්තියෙන් දැනවීමෙන් අපි ඔවුන්ගේ ලබැඳි හිතවතා වීමු. දේශපාලුවන් පස්සේ යමින් ඔවුන්ට ප්‍රශස්ති පුදමින් කිසි දිනක අකුරක් නොලීවෙමු. අපේ රටට ජාතියට මඳ වශයෙන් හෝ කිළුටක්, නින්දාවක් වන එක ද අකුරක් මෙතුවක් අපෙන් ලියැවී නැත. අපේ හිත සැනසෙන්නට ඒ හොඳටම ප්‍රමාණවත් ය.

පෑන තිබෙන්නේ හැමදාම සාක්කුවේ ගසා ගෙන යෑමට නොව අවශ්‍ය වූ විට රිසි සේ ලෙලවන්නටය. සැබෑ පත්‍රකලාවේදියෙකු අත පෑන යනු මුවහත් කඩුවකි. බොරුව ප්‍රෝඩාව නමැති කැලෑව කපා කොටා, ජන සමාජය හෙළ පෙහෙළි කර, සත්‍යයේ බීජ රෝපණය කරන ගොවියාණෝ ඔව්හු ය.

පහළොස්වසරක් ගෙවීයන අද ඔබට අව ධාරණයෙන් කිවයුතු දෙයක් ඇත. ඒ මෙයයි

අප ලියන කියන අදහස් මෙන්ම අපේ අවංකකම ද සිංහල පත්‍රයක් කරනු සඳහා කාගෙන්වත් ණයට ගත් දේ නොව, කවදත් අප තුළම පළපැදියම් වී තිබූ ආචාර ධර්මයෝ වෙති. කොතරම් අභේනියකදී, ආපදාවකදී වුවද ඒ ගති අප අත්හැර නොයන්නේ එබැවිනි. පත්‍රයට එකකුත්, ජීවත්වීමට තව එකකුත් වශයෙන් ජීවන රටා දෙකක් අපට නැත. කොටින්ම මේ ලංකාවිත්ති පත්‍රය දිගහරින විට ඔබ දකින් නේ අන් කිසිවක් නොව අපේ හදවතය !



කර්තෘ




# අවුරුද්දෙන් අවුරුද්ද වෙනස්වන අවුරුද්ද!

**බු**දුන් වහන්සේ දේශනා කළ පරිද්දෙන් ලොව සියලු දේ අනිත්‍ය නම්, වෙනස්වන සුලු නම්, එම ධර්මතාවට හසු නොවන දෙයක් ලොව නැත. මේ අනුව සිංහළ, දෙමළ හෝ වෙන යම් ඕනෑම අවුරුද්ද- ක් වුවත් වෙනස් විය යුතු ය. අවුරුද්ද වශයෙන් අප ගණන් බලන්නේ කාලයාගේ වැයවීමක් හෝ ගෙවී යාමකි. කාලය ද සැනින් වෙනස් වී, ගෙවී යන දෙයකි. එබැවින් කාලය මුල් කරගෙන ජන සමාජය විසින් මෙතෙක් කල් පවත්වාගෙන ආ කෙබඳු උත්සවයක් වුව ද කාලයාගේ ඇවෑමෙන් වෙනස්වීමට භාජනය වී ඇත.

මිනිසාට කාලය මැන ගැනීමට උපකාරී වූ සූර්යයා හා චන්ද්‍රයා දෙවි යන් වශයෙන් සැළකීමට ආදියේ සිට ම ජනතාව පුරුදු වූහ. මක්නිසාද එම දෙවිවරුන් දෙදෙනගේ ආලෝක රශ්මි යෙන් ලොව දකින්නටත් ජීවත්වෙන්නටත් ලැබෙන පිහිටාධාරය නිසා ය.

උදයට පායන හිරු දෙවියන්නේ
සවසට පායන සඳ දෙවියන්නේ

යනුවෙන් අදත් සිංහල ගැමි ජනයා හිරු සඳු දෙවියන් භක්තියෙන් යුතුව සිහිපත් කර වැඩ අරඹන්නේ ඒ නිසා ය. මිනිසාගේ කාල චක්‍රය නිර්මාණය වූයේ සූර්ය චන්ද්‍ර දෙදෙනගේ ගමන මුල් කර ගෙන ය. මේ දෙකින් වඩාත්ම පැරණි ක්‍රමය වශයෙන් සමහරුන් සළකන්නේ චන්ද්‍ර මාස ක්‍රමයයි. සූර්ය මාස ක්‍රමය භාරතයේ භාවිතාවීමට පෙර එම ක්‍රමය අනුගමනය කරන ලද්දේ ග්‍රීක වැසියන් විසින් බවත් එය පසුව භාරතයට හඳුන් වා දුන්නේ මහා ඇලැක්සැන්ඩර් රජු ගේ කාලයේ බවටත් විශ්වාසයක් පවතී.

සූර්ය වර්ෂ ක්‍රමය මෙන්ම චන්ද්‍ර වර්ෂ ක්‍රමය ද ආරම්භයේ සිටම භාවිතයේ පැවති බව පෙනේ. එම ක්‍රම දෙකම ජනතාවගේ සංස්කෘති කෙරෙහි බලපා ඇති අයුරු වටහා ගැන්මට විවිධ ජනයා අනුගමනය කරන ආගමික හා සාමාජයීක උත්සව දෙස බැලිය යුතු ය.

මුස්ලිම්වරුන්ගේ රාමසන් උළෙල පිළියෙල වී ඇත්තේ චන්ද්‍ර මාස ක්‍රම අනුව ය. රාමසන් දිනයේ දී සඳ බැලීම හා නව සඳ අනුව අවුරුද්ද නියම කිරීම අදත් මුස්ලිම් බැතිමතුන් අතර පවත්නා චාරිත්‍රය කි. ක්‍රිස්තු භක්තිකයන් ගේ පාස්කු මංගල්‍යය පිළියෙල වී ඇත්තේ සූර්ය චන්ද්‍ර මාස් ක්‍රමය අනුව ය. බෞද්ධ බැතිමතුන්ගේ අති උතුම් දිනයක් වූ වෙසක් උත්සවය පිළියෙල වී ඇත්තේ චන්ද්‍ර මාස ක්‍රමය අනුව ගණන් බලා වෙසක් මහේ පුර පසළොස්වක් දා ට වැටෙන පිළිවෙලටය. හින්දු ජනයාගේ තෛපොන්ගල් දිනය පිළියෙල වී ඇත්තේ සූර්ය මාස ක්‍රමය අනුව චිත්තිරෙයි නම් වූ බක් මාසයේ දී ය. සිංහලයින්ටත් පොදු වී ඇති එම නැකැත් සංක්‍රාන්තිය අනුව අපි සිංහල අවුරුදු උත්සවය පවත්වමු.

නැකතට වැඩ කිරීමේ සිරිත පුරාණ කාලයේ පටන් අප රටේ පැවති සිරිතකි. එකල නැකැත් හැදූ අය හැඳින්වුනේ මහනැකතිනා, සංවත්සරික නායක ගණනායක වැනි නම් වලිනි. වර්තමාන යේ දී සිංහල අලුත් අවුරුද්ද අප්‍රියෙල් මස 13, 14 වැනි දින වලට යොදාගෙන තිබුණද ආරම්භයේ දී එය බක්මස පුර පැලවියෙන් හෝ බක්මස පළමු වැනි දිනයේ දී පවත්වා ඇති බවට ද සාධක හමු වේ. මාර්තු මස 25 වෙනිදා සිංහල අවුරුදු උත්සවය පැවැත් වූ අවස්ථාවක් ගැන මහනුවර රාජ්‍ය සමයේ අවසාන භාගයෙන් කරුණු හෙළිදරව් වේ. එය එසේ විය යුතුය. එහෙත් හැම අවුරුද්දේම අප්‍රේල් 14 වෙනි දිනට අලුත් අවුරුද්ද යොදා ගැන්ම නම් ජ්‍යොතිශ්‍ය ශාස්ත්‍රඥයින්ගේ හපන්කමින් සිදුවන් නක් විනා ශාස්ත්‍රානුකූලව හෝ විද්‍යානු කූලව සිදුවන කටයුත්තක් විය නොහැ කිය. බක් මසට හිමිව ඇත්තේ සිත නැක තයි. එය මාර්තු මාසයට හිමි නැකතයි.

අලුත් අවුරුද්දේ නැකැත් බලා සියලු වැඩ කටයුතු අරඹන්නට බලා පොරොත්තු වන අය ඒ කටයුතු ඒ අයුරින්ම ඉටු කරත්වායි ප්‍රාර්ථනා කරමි. අලුත් අවුරුදු නැකැත් කාලය යම්යම් දේ කිරීමට හොඳ කාලයයයි ඔබ සිතන්නේ නම් සිංහල අලුත් අවුරුද්ද එය යි.

**ඔබ සැමට**
**සුභ අලුත් අවුරුද්දක් වේවා !**

***අභාවප්‍රාප්ත මහාචාර්ය***
***♦ අනුරාධ සෙනෙවිරත්න***

## ✻ නව සහශ්‍රයට ධර්මානුශාසනා ✻

### *හිතෝපදේශයෙන්*

කෘතස්‍ය කරණං නාස්ති
ප්‍රාගෙවාන: පරීක්ෂතාම්
අචින්ත්‍යකෘතං කර්ම
පශ්චත්තාපාය වර්නනතෙ

***අර්ථය*** : **කළ දෙයට කළමනා දෙයක් නැත. එහෙයින් කටයුත්ත කරන්නට පළමු ඉන්වන වැඩ අවැඩ සිත තබා පරීක්ෂාකරනු ලැබේවා. යහපත නපුර නොසලකා කළ කටයුත්ත මා කළ සේ නපුරැයි පසුතැවිලි පිණිස පවතී.**

**මෙම** කාව්‍ය කියවන විටම අපට මතක්වන්නේ සිංහළයේ ඇති **පනින්ට පෙර සිතා බලනු** යන ප්‍රස්ථාව පිරුළයි. යමක් කිරීමට පෙර දෙතුන් වතාවක් තබා, වරක් හෝ සිතා බැලීම නුවණට හුරුය. හේතුව **ඉක්මන් කොටයි** යන කියමනට අනුව ඉක්මන් තීරණ ගැනීම අවාසිදායක වියහැකි බැවිනි.

පොදුවේ ගත් කල සාමාන්‍ය මිනිසා අතර පෙනෙන්නට තිබෙන එක් පුද්ගල දුර්වලතාවකි හැම කටයුත්තකදීම ඉක්ම- න් තීරණ ගැනීම. ඉක්මන් තීරණ හෙවත් ක්ෂණික තීරණ ගතයුතු අවස්ථා ඇත. හදිසි අනතුරකදී, හදිසි ආපදාවකදී වගේ අවස්ථාවකදී කල්පනා කරකර ඉඳීමෙන් පලක් නැත. ඉක්මන් තීරණයක් ගෙන වහා ක්‍රියාත්මක විය යුතුය. නමුත් දුරදිග බලා හොඳට සිතා මතා ගතයුතු තීරණ වලදී බොහෝ දෙනා ඉක්මන් වෙනවා වැඩිය. ඉන් අත්වන්නේ අයහපතක් හෝ පාඩුවකි. නොඑසේනම් විනාශයකි. එයම ඔහුගේ පසුතැවිල්ලට හේතුවේ.

බුදුරජාණන් වහන්සේ රාහුල පොඩි හුමුදුරුවන් වහන්සේට කැඩපත උපමාවට ගෙන වදාළේ කණ්ණාඩියේ කැඩපතේ අවශ්‍යතාවය. එය දෙස බලබලා මුහුණේ අඩුපාඩු සකස්කරගැනීමයි. එමෙන් හොඳට සිතා බලා තමාගේ හා ලෝකයාගේ යහපත උදෙසාම කළයුතු දේ කිරීමත් වැරදි මගහරවා නිසිදේ කිරීම යහපත් වන බවයි.

**ධම්මපදයේ** එන එක් වැදගත්ම ගාථාවකට අනුව ද උන් වහන්සේ පහදා දෙන්නේ යම් කටයුත්තක් කිරීමෙන් වන ප්‍රතිපලය කඳුළු වැකුණු මුහුණෙන් යුතුව පසුතැවිලි වෙමින් විඳින්නට සිදුවන්නේ නම් එබඳු අයහපත් දේ කිසිවිටෙක නොකළ යුතු බවයි. එසේ වුවහොත් ඊට හේතුව, අප සිතා නොබලා, මෝඩකම නිසා, මුලාවට පත්ව තීරණ ගැන්මයි.

ඉක්මන් තීරණ ගැනීම නිසා නොයෙක් ව්‍යාපාර සඳහා මුදල් යොදවා ඒවා නැතිකරගන්නා ව්‍යාපාරිකයෝද, ඉක්මන් තීරණ ගෙන ඉක්මනින් විවාහ වී අන්තිමේදී එම විවාහය බේදවාචකයකින් අවසන් කරගන්නා අඹු සැමියෝද, ඉක්මන් කෝපය නිසා ජීවිතවලින් පවා වන්දි ගෙවන පුද්ගලයෝද, දෙමාපිය වැඩිහිටියන්ගේ අවවාදයන් නුරුස්සා ඒවා නොපිළිගෙන තම සිතැඟි පරිදි කටයුතුකර ජීවිත අවාසනාව- න්ත කරගන්නා තරුණ ළමයිද අප සමාජයේ කොතෙකුත් සිටිති. අද ලෝකය පුරා මාධ්‍ය වල ප්‍රධාන පුවත් ලෙස නිතර මෙවැනි සිද්ධීන් පළකරනු අපට දැකිය හැක.

මෙම පද්‍යයට අනුව කළ වැඩේ කර අවසන් වූවාට පසු යළිදු එහි කරන්නට දෙයක් ඉතිරිව නැත. තමා අතින් වූ වැරැද්ද යළි සකස්කර ගැන්ම අපහසුය. එය කර අවසාන බැවිනි. ඒ නිසා එයින් දෙන උපදේශය වන්නේ වැරැද්දක් ඇති නොවීමට නම් යමක් කිරීමට පෙර එම ක්‍රියාවේ ප්‍රතිඵලය ගැන හොඳට සිතා බැලිය යුතු බවයි.

එක් රජතුමෙක් වනයේ ඇවිදින විට පොකුණක නෙළුම් කොළයක "**සහස විබද්ධ නක්‍රියා**" යනුවෙන් ලියා ඇති වගන් තියක් දුටුවේය. එහි තේරුම '**වහා ක්‍රියා කරන්න එපා!**' යන්නයි. රජ ඒ කියමන රන් තහඩුවක කොටවා සිය යහන් ගබඩාවේ ඇඳට උඩින් පෙනෙනසේ එල්ලා තැබුවේය. දිනක් තම බිසව තරුණයෙකු සමග සිටිනවා දුටු රජු වහා කිපී ඔවුන් දෙදෙන මැරීමට කඩුව ඇද්දේය. එවිටම අර ශ්ලෝකය දැක මඳක් ඉවසුවේ ය. පසුව සොයා බලද්දී රජතුමා දැන ගත්තේ කලකට පෙර නැතිවූ තම පුතා සිය මව සමග සිටි බවයි.



***♦ රාජකීය පණ්ඩිත - ශාස්ත්‍රපති***
***පූජ්‍ය විල්ඔය විමලජෝති හිමි***

**NORMA & Co**
**Associate Solicitors**

2 Queens Parade
Green Lanes, London N8 0RD
Tel. 020 8348 7772 / 07717173414

Any type of Visa Applications
Car Accidents

***Colombo Office***
Visa Applications & Any Refusals
100/6 Rosemead Place
Colombo 7
Tel. 2672432 / 0777686632